# කර්මාන්ත

## සමස්ත උපනතීන්

1988 වර්ෂයේ කර්මාන්ත නිමැවුමේ වටිනාකම මූර්ත වශයෙන් සියයට 6 කින් වර්ධනය වූ බවට ඇස්තමේන්තු කර ඇත. 1987 දී මෙම වර්ධන වේගය සියයට 8 ක් විය. පෞද්ගලික අංශයේ කර්මාන්ත නිමැවුම සියයට 11 කින් ඉහළ ගිය අතර, රාජ්‍ය අංශයේ කර්මාන්ත සියයට එකකින් පහත වැටිණි. විදුලි බල සැපයුමට බාධා ඇතිවීම, සේවා ස්ථාන කරා පැමිණීමේ දුෂ්කරතා සහ සමහර පළාත්වල භාණ්ඩ බෙදා හැරීමේ වැඩ පිළිවෙල අඩපණවීම යන කරුණු කාර්මික නිමැවුමේ වර්ධනය අඩු වීමට මූලික වශයෙන් හේතු විය.

ජාතික පේෂකර්ම, ලංකා තෙල් සහ මේද, රාජ්‍ය දැව, ජාතික කඩදාසි, රාජ්‍ය ඉස්කාගාර සහ බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් වැනි රාජ්‍ය අංශයේ වැදගත් කාර්මික ව්‍යවසායයන් ගණනාවකම පැවති අඩු නිමැවුම් මට්ටම්, රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි දුර්වල ක්‍රියාකාරිත්වයට හේතු විය. පෞද්ගලික අංශයේ කර්මාන්ත නිමැවුමේ වර්ධනය ප්‍රධාන වශයෙන් රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත, සකස් කළ ලෝහ නිෂ්පාදිත සහ ආහාර හා පානවර්ග යන අංශයන්ගෙන් සිදු විය.

දේශීය කර්මාන්තයන්ට ඉහළ සඵල ආරක්ෂණ මට්ටමක් සැපයීම, අපනයන නිෂ්පාදනයන්හි නියුතු කර්මාන්ත උනන්දු කිරීම සහ දේශීය වශයෙන් ඉහළ එකතු කළ අගයක් ගෙන දෙන කර්මාන්ත ප්‍රසාරණය කිරීම මගින් කර්මාන්ත අංශයේ වර්ධන වේගය පවත්වාගෙන යාම සඳහා තිරු බදු ප්‍රතිපත්තිය තවදුරටත් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරනු ලැබීය. රෙදිපිළි, සම් නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත වැනි කර්මාන්තයන් තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් ඇතැම් යන්ත්‍රෝපකරණ සඳහා වූ ආනයන පාලන නීති රීති ලිහිල් කරන ලදී. මධ්‍යම හා විශාල පරිමාණයේ ව්‍යවසායයන්ට ආධාර පිණිස ලෝක බැංකුවෙන් හා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය පහසුකම් ලබා ගැනීම සඳහා වූ සම්මුතීන්ට එළැඹුණි. මෙයට ප්‍රාග්ධන පහසුකම් සහ අපනයන පරිපාලන කටයුතු, ප්‍රාග්ධන වෙළෙඳපොලවල් සහ සංවර්ධන මූල්‍යායතනයන්හි කාර්යක්ෂමතාවය නඟා සිටුවීම සඳහා වන තාක්ෂණික සහාය ද ඇතුළත් විය. තෙවන කුඩා හා මධ්‍ය පරිමාණ කාර්මික ණය යෝජනා ක්‍රමය (කු.ම.ක. 111) 1988 අප්‍රේල් මාසයේදී ආරම්භ විය.

### ආයෝජන

1988 වර්ෂයේදී දේශීය ආයෝජන උපදේශක කමිටු මගින් අනුමත කරන ලද නව කර්මාන්තයන්හි සැළකිය යුතු වැඩි වීමක් වාර්තා කෙරිණි. වර්ෂය තුළ දේශීය ආයෝජන උපදේශක කමිටු (දේ.ආ.උ.ක.) ව්‍යාපෘතීන් 608 ක් අනුමත කරන ලදී. පසුගිය වසරේ එය 364 ක් විය. මෙම ව්‍යාපෘතිවල අපේක්ෂිත මුළු ආයෝජන රුපියල් දශ ලක්ෂ 1,142 ක් වූ අතර ඒවා මගින් පුද්ගලයින් 18,633 කට සේවා නියුක්තිය සැපයීමට අපේක්ෂිතය.

විදේශීය ආයෝජන උපදේශක කමිටුව (වි.ආ.උ.ක.) 1988 වර්ෂයේ කාර්මික ව්‍යාපෘති 45 ක් අනුමත කළාය. පසුගිය වසරේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව 41 ක් විය. මෙම ව්‍යාපෘතිවලින් රුපියල් දශ ලක්ෂ 954 ක් මුළු ආයෝජන වශයෙන් අපේක්ෂා කළ අතර, එයින් රුපියල් දශ ලක්ෂ 225 ක් විදේශීය ආයෝජන වේ. මෙයින් ව්‍යාපෘති 21 ක් මූලික ලෝහ හා රසායනික නිෂ්පාදිත අංශයට අයත් වේ. අපේක්ෂිත මුළු සේවා නියුක්තිය පුද්ගලයින් 3,542 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) 1988 වර්ෂයේදී ව්‍යාපෘති 31 ක් අනුමත කළාය. පසුගිය වර්ෂයේ අනුමත ව්‍යාපෘති සංඛ්‍යාවද 31 ක්ම විය. අපේක්ෂිත මුළු ආයෝජනය රුපියල් දශ ලක්ෂ 1,727 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එයින් රුපියල් දශ ලක්ෂ 1,120 ක් විදේශීය ආයෝජන වේ. මුළු සේවා නියුක්ති උත්පාදනය පුද්ගලයින් 12,164 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත. 1988 වර්ෂය අවසන් වනවිට මහ කොළඹ ආර්ථික කොමිසමෙහි අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව 283 ක් වූ අතර, එයින් 164 ක් මහ කොළඹ ආර්ථික කොමිසම සමග කර්මාන්ත පිහිටුවීමට ගිවිසගෙන ඇත.

**නිෂ්පාදනය**

1988 වර්ෂයේ කාර්මික නිමැවුම් වටිනාකම මූර්ත වශයෙන් සියයට 6 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වර්ෂයේදී සියයට 8 ක් විය. ඛනිජ තෙල් නිෂ්පාදන වටිනාකම ඉවත් කොට බලන කල, කාර්මික නිෂ්පාදනය සියයට 5 කින් වැඩිවී ඇති බවට ඇස්තමේන්තු කර ඇත.

මූලික ලෝහ නිෂ්පාදිත (සියයට 21), රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත (සියයට 12), සකස් කළ ලෝහ නිෂ්පාදිත (සියයට 9), රසායනික නිෂ්පාදිත, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත සහ ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (සියයට 5 බැගින්) යන කාර්මික උප අංශයන් නිමැවුමේ වර්ධනයන් වාර්තා කර ඇත. මෙම වර්ෂය තුළදී දැව කපා හෙළීමේ කටයුතු අඩපණ වීමෙන් රාජ්‍ය දැව සහ ලංකා තුනී ලෑලි යන සංයුක්ත මණ්ඩලයන්හි පැවති අඩු නිෂ්පාදන මට්ටම දැව හා දැව නිෂ්පාදිත අංශයේ වූ සියයට 17 ක පහත වැටීමට මූලික වශයෙන් හේතු විය.

ආයෝජන ප්‍රවර්ධන කලාපයන් ඇතුළත මෙන්ම ඉන් පිටත ඇඟලුම් කර්මාන්තයේ වූ අඛණ්ඩ වර්ධනය රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත අංශයේ දක්නට ලැබුණු ඉහළ නිමැවුම් මට්ටමට ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වුවත්, මෙම අංශයෙහි රාජ්‍ය අංශයේ නිමැවුම සියයට 5 කින් අඩුවී ඇත. ආහාර, පාන වර්ග සහ දුම්කොළ ගණයෙහි රාජ්‍ය අංශයේ වූ සැලකිය යුතු පහත වැටීම බොහෝදුරට සමහන් වූයේ, එම ගණයෙහිම මස්, පිටි, රසකැවිලි සහ බිස්කට් වැනි පෞද්ගලික අංශයේ ද්‍රව්‍යයන් නිමැවුම වැඩි වීමෙනි. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිතයන්හි වූ ආන්තික අඩුවීම, ප්‍රධාන වශයෙන්ම ජාතික කඩදාසි සංයුක්ත මණ්ඩලයේ පැවති අඩු නිෂ්පාදන මට්ටමේ ප්‍රතිඵලයකි. රසායනික නිෂ්පාදිත, ඛනිජ තෙල් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත අංශයේ වූ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ඛනිජ තෙල් පිරිපහදුවේ මෙන්ම රසායනික නිෂ්පාදිත, රබර්, ප්ලාස්ටික් සහ ඖෂධ ද්‍රව්‍ය වැනි පෞද්ගලික අංශයේ කර්මාන්ත ගණනාවකද නිමැවුම වැඩි වීමයි. ඇස්බැස්ටස්, වීදුරු සහ පිඟන් භාණ්ඩ වැනි පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි නිමැවුම ඉහළ යාම ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත අංශයේ වූ නිමැවුම් වර්ධනයට හේතු විය. මූලික ලෝහ නිෂ්පාදිත අංශයේ වූ නිමැවුම් වැඩිවීම, මුළුමනින්ම පාහේ වානේ සංස්ථාවේ නිමැවුම ඉහළ යාමේ ප්‍රතිඵලයකි. යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ, ජලනල සහ විදුලි බුබුළු වැනි පෞද්ගලික අංශයේ කර්මාන්ත ගණනාවක නිෂ්පාදනය වැඩිවීම, සකස් කළ ලෝහ නිෂ්පාදිත අංශයේ වූ නිමැවුම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

1988 වර්ෂයේදී කාර්මික නිෂ්පාදන වටිනාකම, පවත්නා මිළ අනුව සියයට 11 කින් වැඩිවී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. මූලික ලෝහ නිෂ්පාදිත සියයට 59 කින්ද, සකස් කළ ලෝහ නිෂ්පාදිත සියයට 23 කින්ද, රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත සියයට 18 කින්ද, ආහාර, පාන වර්ග සහ දුම්කොළ සියයට 13 කින්ද, කඩදාසි නිෂ්පාදිත සියයට 9 කින්ද, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සියයට 5 කින් සහ රසායනික නිෂ්පාදිත සියයට 2 කින්ද වශයෙන් නිමැවුම් මට්ටම් වැඩිවී ඇත.

## 1 . 15 සංඛ්‍යා සටහන

### කාර්මික නිෂ්පාදන වටිනාකම 1984 – 1988 (වර්තන මිළ අනුව)

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | 1984 | 1985 | 1986 | 1987 | 1988 (අ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 8,623 | 10,497 | 12,129 | 12,962 | 14,675 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 7,565 | 9,505 | 12,088 | 15,428 | 18,166 |
| 3. දැව හා දැව නිෂ්පාදිත .. | 640 | 705 | 632 | 677 | 640 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 907 | 1,187 | 1,289 | 1,372 | 1,492 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 14,328 | 13,104 | 11,088 | 13,477 | 13,681 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 1,829 | 1,854 | 2,053 | 2,156 | 2,267 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 199 | 123 | 281 | 307 | 487 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ .. | 1,456 | 1,592 | 1,757 | 2,006 | 2,477 |
| 9. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත .. | 106 | 125 | 136 | 155 | 178 |
| එකතුව .. | 35,653 | 38,692 | 41,453 | 48,540 | 54,063 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

### රාජ්‍ය අංශයේ කර්මාන්ත

ඉකුත් වර්ෂයේදී මෙන්ම, 1988 වර්ෂයේදී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම මූර්ත වශයෙන් සියයට 1 කින් පහත වැටුණි. මෙය විශේෂයෙන්ම ජාතික පේෂකර්ම, ලංකා තෙල් හා මේද, ජාතික කඩදාසි, රාජ්‍ය දැව, රාජ්‍ය ඉස්කාගාර සහ බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් වැනි රාජ්‍ය අංශයේ වැදගත් කාර්මික ව්‍යවසායයන් ගණනාවක නිෂ්පාදනය අඩු වීමේ ප්‍රතිඵලයකි. මෙවැනි අඩු වීම් ලංකා ඛනිජ තෙල්, ලංකා වානේ සහ ශ්‍රී ලංකා සීනි යන සංස්ථාවල නිෂ්පාදන වර්ධනයන් මගින් බොහෝදුරට සමහන් විය.

## 1 . 16 සංඛ්‍යා සටහන

### රාජ්‍ය අංශයේ ප්‍රධාන කර්මාන්ත නිමැවුම් දර්ශකය (1977=100)

| කාර්මික ගණය | 1986 | 1987 | 1988 (අ) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 46·6 | 40·7 | 31·0 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 208·0 | 200·0 | 189·7 |
| 2.1 රෙදිපිළි .. | 278·9 | 271·3 | 257·6 |
| 3. දැව හා දැව නිෂ්පාදිත .. | 103·4 | 103·8 | 71·4 |
| 4. කඩදාසි හා කඩදාසි නිෂ්පාදිත .. | 160·6 | 167·9 | 153·7 |
| 5. රසායනික නිෂ්පාදිත .. | 114·9 | 115·3 | 119·3 |
| 5.1 ඛනිජ තෙල් .. | 115·3 | 115·9 | 120·7 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත .. | 132·7 | 147·3 | 142·4 |
| 6.1 සිමෙන්ති .. | 154·4 | 177·3 | 175·1 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත .. | 64·1 | 71·1 | 86·1 |
| 8. සකස් කළ ලෝහ නිෂ්පාදිත .. | 141·9 | 102·5 | 65·6 |
| සියළුම ගණයන් .. | 116·2 | 115·7 | 114·0 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත හැර .. | 117·2 | 115·4 | 106·4 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# රාජ්‍ය අංශයේ කර්මාන්ත නිමැවුම් දර්ශකය




ශ්‍රී ලංකා මහ බැංකුව.

ලංකා ඛනිජ වැලි (සියයට 46), රාජ්‍ය දැව (සියයට 43), ලංකා තෙල් හා මේද (සියයට 36), රාජ්‍ය ලෝහ භාණ්ඩ (සියයට 25), රාජ්‍ය ඉස්කාගාර (සියයට 23), ජාතික කඩදාසි (සියයට 8), ශ්‍රී ලංකා ටයර් (සියයට 6), ජාතික පේෂකර්ම (සියයට 5), බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් (සියයට 60) සහ සීමාසහිත රාජ්‍ය රබර් නිෂ්පාදන සමාගම (සියයට 15) යන රාජ්‍ය අංශයේ කාර්මික ව්‍යවසායයන් අඩු නිමැවුම් මට්ටම් වාර්තා කර ඇත.

වර්ෂය අවසාන භාගයේදී විදුලි බල සැපයුමට වූ බාධක, සේවකයන් සේවයට නොපැමිණීම සහ නිමි භාණ්ඩ බෙදා හැරීමේ දුෂ්කරතා වැනි හේතූන් රාජ්‍ය අංශයේ කාර්මික නිෂ්පාදනය කෙරේ අහිතකර ලෙස බලපෑවේය. යාන් ඔයේ සිට පුල්මුඩෙයි කම්හල දක්වා ජලය සැපයීමේ යෝජනා ක්‍රමයට බාධක පැමිණියෙන් ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ නිමැවුම අඩු විය. මූල්‍ය අලාභ හේතුකොටගෙන ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලයට එහි නිෂ්පාදනය සීමා කිරීමට සිදු විය. වර්ෂය තුළ පැවති අහිතකර කාලගුණික තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික ලුණු සහ සීමාසහිත රාජ්‍ය රබර් නිෂ්පාදන සමාගම වැනි ව්‍යවසායයන්ගේ නිෂ්පාදනය පහත වැටුණි. ශ්‍රී ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයේ නිමැවුම අඩු වීමට තුඩු දුන් සාධකය වූයේ 'ක්ලින්කර්' සැපයුම අඩු වීමය. දැව කපා හෙළීමේ කටයුතු අඩාල වීමෙන් දැව සැපයුම අඩු වූ නිසා, ලංකා තුනී ලෑලි සහ රාජ්‍ය දැව යන සංස්ථාවන්හි නිමැවුම පහත වැටුණි.

නිමැවුම් වර්ධනයන් වාර්තා කරන ලද කාර්මික සංස්ථාවන් ලෙස ශ්‍රී ලංකා සීනි (සියයට 47), ලංකා වානේ (සියයට 21) සහ ලංකා ඛනිජ තෙල් (සියයට 4) යන සංස්ථා දැක්විය හැකිය.

රාජ්‍ය අංශයේ සමස්ත කාර්මික නිමැවුමෙන් අඩකට පමණ දායක වන, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිෂ්පාදනය වැඩි වීමට ප්‍රධාන හේතුව වූයේ, මෙම වර්ෂය තුළදී තෙල් පිරිපහදුව කිසිදු බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමය. වගා කරනු ලැබූ බිම් ප්‍රමාණය වැඩි වීම නිසා සෙවනගල කම්හලෙහි නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි වූ අතර එය ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ නිමැවුම ඉහළ යාමට හේතු විණි. වානේ සංස්ථාවේ නිෂ්පාදනය ඉහළ යාමට මූලික වශයෙන් හේතු වූයේ අමු ද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුකම් ප්‍රමාණවත් මට්ටමක පැවතීමයි.

වර්ෂය තුළදී දිවයිනේ පැවති අසහනකාරී වාතාවරණය යටතේ වුවද, රාජ්‍ය කාර්මික සංස්ථාවන් විශාල ප්‍රමාණයක් ලාභ උපදවා ගැනීමට සමත් වී ඇත. 1988 වසරේ ලාභ පෙන්වූ ව්‍යවසායයන් වශයෙන් රාජ්‍ය ඉස්කාගාර (රුපියල් දශ ලක්ෂ 36), ජාතික පේෂකර්ම (රුපියල් දශ ලක්ෂ 30), ලංකා පිහන් (රුපියල් දශ ලක්ෂ 15), ශ්‍රී ලංකා ටයර් (රුපියල් දශ ලක්ෂ 13), ශ්‍රී ලංකා ලුණු (රුපියල් දශ ලක්ෂ 11), ලංකා ඔක්සිජන් (රුපියල් දශ ලක්ෂ 14), කොළඹ ගෑස් සහ ජල සමාගම (රුපියල් දශ ලක්ෂ 42) සහ සීමාසහිත රාජ්‍ය රබර් නිෂ්පාදන සමාගම (රුපියල් දශ ලක්ෂ 5) යන සංස්ථා දැක්විය හැකිය.

ඇස්තමේන්තුවලට අනුව වසර තුළදී රාජ්‍ය අංශයේ ව්‍යවසායයන්ට කෙරුණු රාජ්‍ය අරමුදල් සංක්‍රාමයන්හි වටිනාකම රුපියල් දශ ලක්ෂ 435 ක් විය. මෙය, රුපියල් දශ ලක්ෂ 243 (සියයට 56) ක ප්‍රාග්ධන සංක්‍රාම වලින් සහ ඉතිරි රුපියල් දශ ලක්ෂ 192 (සියයට 44) ක වර්තන සංක්‍රාමයන්ගෙන් සමන්විත විය. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය විසින් රුපියල් දශ ලක්ෂ 205 ක් එනම්, රාජ්‍ය අංශයේ කර්මාන්තවලට 1988 වසරේදී කරන ලද මුළු රාජ්‍ය සංක්‍රාම වලින් සියයට 47 ක් ලබා ගන්නා ලදී. ජාතික කඩදාසි, ලංකා වානේ, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ, ලංකා පොහොර, ජාතික කිරි (සීමාසහිත මිල්කෝ ලෙස පෞද්ගලීකරණය කරන ලද), රාජ්‍ය පොහොර නිෂ්පාදන සහ ජාතික පේෂකර්ම සංස්ථාව යන සංස්ථා සෙසු සංක්‍රාමලාභී කාර්මික ව්‍යවසායයන් විය.

## 1 . 17 සංඛ්‍යා සටහන

## කාර්මික ව්‍යවසායයන්ට කෙරුණු රාජ්‍ය අරමුදල් සංක්‍රාම 1986 – 1988

රුපියල් දශ ලක්ෂ

| සංස්ථාව/ව්‍යවසායය | ප්‍රාග්ධනය | | | වර්තන | | | මුළු ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1986 | 1987 | 1988 (අ) | 1986 | 1987 | 1988 (අ) | 1986 | 1987 | 1988 (අ) |
| 1. ජාතික කඩදාසි සංස්ථාව .. | — | — | — | 7·7 | 8·0 | 7·8 | 7·7 | 8·0 | 7·8 |
| 2. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය .. | 131·0 | 195·0 | 155·5 | 127·1 | 42·0 | 50·0 | 258·1 | 237·0 | 205·5 |
| 3. ලංකා වානේ සංස්ථාව .. | — | — | — | 4·8 | — | 96·9 | 4·8 | — | 96·9 |
| 4. ජාතික කිරි මණ්ඩලය .. | 3·2 | 2·5 | 2·5 | 95·9 | — | 29·0 | 99·1 | 2·5 | 31·5 |
| 5. ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය .. | — | — | — | — | — | 8·4 | — | — | 8·4 |
| 6. රාජ්‍ය පොහොර නිෂ්පාදන සංස්ථාව .. | — | — | 21·0 | 26·3 | — | — | 26·3 | — | 21·0 |
| 7. ලංකා පොහොර සංස්ථාව .. | 3·0 | 27·2 | 21·8 | 19·0 | — | — | 22·0 | 27·2 | 21·8 |
| 8. ජාතික පේෂකර්ම සංස්ථාව .. | 42·0 | 42·0 | 42·0 | 29·1 | — | — | 71·1 | 42·0 | 42·0 |
| එකතුව .. | 179·2 | 266·7 | 242·8 | 309·9 | 50·0 | 192·1 | 489·1 | 316·7 | 434·9 |

(අ) අනුමත ඇස්තමේන්තු.

මූලය : මහා භාණ්ඩාගාරය.

### බලශක්ති සහ ඉන්ධන

ලංකා විදුලිබල මණ්ඩලය හැර කර්මාන්තවලට අලෙවි කරනු ලැබූ ඉන්ධන ප්‍රමාණය 1988 දී සියයට 2 කින් වැඩි විය. උදුන් තෙල් අලෙවිය සියයට 2 කින් ඉහළ ගිය අතර, බැර ඩීසල් අලෙවිය වර්ෂය තුළදී සියයට 3 කින් පහත වැටුණි.

## 1 . 18 සංඛ්‍යා සටහන 1986 – 1988

## කර්මාන්තයන්හි බල හා ඉන්ධන භාවිතය

| ශීර්ෂය | 1986 | 1987 | 1988 (අ) |
|---|---|---|---|
| 1. විදුලි බලය (ගිග වොට් පැය) (ආ) .. | 925·3 | 865·9 | 925·0 |
| 1·1 කුඩා පරිමාණ කර්මාන්ත .. | 35·6 | 38·9 | 43·0 |
| 1·2 මධ්‍යම පරිමාණ කර්මාන්ත .. | 444·8 | 449·5 | 478·4 |
| 1·3 විශාල පරිමාණ කර්මාන්ත .. | 444·9 | 377·5 | 403·6 |
| 2. කාර්මික ඉන්ධනවල දේශීය අලෙවිය (ඇ) (මෙට්‍රික් ටොන් දහස්) .. | 149·5 | 180·3 | 183·6 |
| 2·1 බැර ඩීසල් .. | 19·8 | 18·6 | 18·1 |
| 2·2 උදුන් තෙල් .. | 129·7 | 161·7 | 165·5 |

මූලයයන් : ලංකා විදුලි බල මණ්ඩලය;
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.

(අ) තාවකාලික.

(ආ) කාර්මික නිෂ්පාදන සහ අපනයන සැකසුම් කර්මාන්තද ඇතුළත්ය. කිලෝවෝල්ත ඇම්පියර් 50 ට අඩු ධාරිතාවයක් ඇති ඒවා කුඩා පරිමාණ කර්මාන්ත වශයෙන්ද, කිලෝවෝල්ත ඇම්පියර් 50–500 අතර ධාරිතාවයක් ඇති ඒවා මධ්‍යම පරිමාණ කර්මාන්ත වශයෙන්ද, කිලෝවෝල්ත ඇම්පියර් 500 ට වැඩි ධාරිතාවයක් ඇති ඒවා විශාල පරිමාණ කර්මාන්ත වශයෙන්ද නිර්වචනය කෙරේ.

(ඇ) ලංකා විදුලි බල මණ්ඩලයට කෙරුණු විකිණීම් හැර.

කර්මාන්තයන්හි විදුලි බල භාවිතය 1988 වසර තුළදී සියයට 7 කින් ඉහළ ගියේය. මෙය සුළු පරිමාණ කර්මාන්තයන්හි සියයට 11 කින්ද, මධ්‍යම පරිමාණ කර්මාන්තයන්හි සියයට 6 කින් සහ විශාල පරිමාණ කර්මාන්තයන්හි සියයට 7 කින් වශයෙන් වැඩි වීම නිසා සිදු විය.

## ආයෝජන ප්‍රවර්ධන කලාපය

1988 වසරේදී, මහ කොළඹ ආර්ථික කොමිසම (ම.කො.ආ.කො.) විසින් ව්‍යාපෘති 31 ක් අනුමත කිරීමත් සමග 1988 වසර අවසන් වනවිට අනුමත කරනු ලැබූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 283 ක් විය. මෙයින් ව්‍යාපෘතීන් 164 ක් කර්මාන්ත ආරම්භ කිරීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම සමඟ ගිවිසුම් අත්සන් කොට තිබිණි. කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය (ක.ආ.ප්‍ර.ක.) තුළ වාණිජමය නිෂ්පාදන කටයුතුවල නිරත වූ මුළු ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව 69 ක් වූ අතර, බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපය (බි.ආ.ප්‍ර.ක.) තුළ ව්‍යවසායයන් 11 ක් සහ මෙම කලාප වලින් පිටත ව්‍යවසායයන් 21 ක් නිෂ්පාදන කටයුතුවල නියැලී සිටියහ. ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘතීන් අතරින් 44 ක් අපනයනය සඳහා වන මසා නිම කළ ඇඳුම් සහ ඊට අදාළ නිෂ්පාදනයන්හි නිරත විය.

1988 වසරේ ම. කො. ආ. කො. විසින් අනුමත කරනු ලැබූ ව්‍යාපෘතීන්ට, සම් අත් වැසුම්, ශල්‍ය වෛද්‍ය අත්වැසුම්, තුවා, නාන ඇඳුම්, කාන්තා ගිම්හාන ඇඟලුම්, රබර් දැව ගෘහ භාණ්ඩ, සක්‍රිය අඟුරු, රබර් ආශ්‍රිත නිෂ්පාදිත, පෝසිලේන් ප්‍රතිමා, කිරි ගරුඬ සහ කලු ගල්, වානේ අච්චු සහ ඩයි වර්ග, නාවුක ක්‍රීඩා උපකරණ, හිම ක්‍රීඩා පාවහන්, ඉලෙක්ට්‍රොනික් සහ විද්‍යුත් ආම්පන්න, එළවළු සහ කොමඩු, විසිතුරු පැළැටි, යන්ත්‍ර සූත්‍ර, වාණිජමය හා ගෘහමය විදුලිය විහිදුවීමේ උපකරණ යනාදී නිෂ්පාදනද පරිගණක සියුම් උපකරණ වර්ධනය, බහාලූ සේවා සැපයුම සහ මල් වගා කිරීම ඇතුළත් වෙයි.

1988 වසරේ ම.කො.ආ.කො. හි දළ අපනයන ඉපැයීම් වන රුපියල් දශ ලක්ෂ 9,546 (විගැහි දශ ලක්ෂ 223) 1987 වසරට වඩා සියයට 27 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. විගැහි වටිනාකම අනුව එය සියයට 10 ක වැඩි වීමක් පිළිබිඹු කරයි. රෙදිපිළි සහ මසා නිම කළ ඇඳුම් අංශය අපනයන ඉපැයීම් වලින් සියයට 73 ක් අයත් කර ගත්තේය.

### 1.19 සංඛ්‍යා සටහන

### ආයෝජන ප්‍රවර්ධන කලාපය – සේවා නියුක්තිය සහ අපනයන ඉපැයුම් 1987 – 1988

| කාර්මික ගණය | 1987 | | 1988(අ) | |
|---|---|---|---|---|
| | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) (ගණන) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ | සේවා නියුක්තිය (දෙසැම්බර් අවසානයට) (ගණන) | දළ අපනයන ඉපැයුම් (නැ.වි.ස.) රු. දශ ලක්ෂ |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ .. | 641 | 147·0 | 796 | 199·3 |
| 2. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් නිෂ්පාදිත .. | 38,342 | 5,989·2 | 39,848 | 6,978·7 |
| 3. දැව හා දැව නිෂ්පාදිත (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 56 | 4·0 | 77 | 6·2 |
| 4. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත .. | 1,999 | 273·0 | 2,285 | 378·7 |
| 5. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත (ඛනිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 2,132 | 309·5 | 2,817 | 667·3 |
| 6. සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 435 | 177·0 | 1,202 | 413·9 |
| 7. අන් තැනක සඳහන් නොවූ නිෂ්පාදිත .. | 3,333 | 424·7 | 3,680 | 497·1 |
| 8. සේවා (ආ) .. | 3,805 | 209·8 | 3,921 | 405·2 |
| එකතුව .. | 50,743 | 7,534·1 | 54,626 | 9,546·3 |

(අ) තාවකාලික.

(ආ) "එයාර් ලංකා සමාගම" හැර.

මූලය : මහ කොළඹ ආර්ථික කොමිසම.